# පුංචි මගේ කවි සිතුවිලි



ආදර්ශ්නා ගජේන්ද්‍රා

# පුංචි මගේ කවි සිතුවිලි

ආදර්ශ්නා ගජේන්ද්‍රා

# පුංචි මගේ කවි සිතුවිලි

**ආදර්ශ්නා ගජේන්ද්‍රා**
**කතෘ**

**කතෘගේ වෙනත් කෘති**

- ගුරුතුමීට තෑග්ගක් ISBN 978-624-592-2 (15. 11.2023)
- කවිමුතුවැල් ISBN 978-624-206-593-9 (15. 11.2023)
- අත්තම්මගේ දත වැටිලා ISBN - 978-624-208-095-6 (15. 11.2023)
- කරුණාවන්ත මායා ISBN - 978 -624-208-348-3 (02. 08. 2025)
- පුංචි මගේ කවි සිතුවිලි ISBN - 978-624-208-349-0 (02. 08. 2025)
- හතේ චිත්ති හතක් (15. 11.2023)
- The little seed's big adventure ISBN - 978-624-206-715-5 (15. 11.2023)
- Caterpillar's Magical Journey ISBN - 978-624-206-716-2 (15. 11.2023)
- The Little Raindrop ISBN 978-624-206-717-9 (15. 11.2023)
- Everyone Special ISBN 978-624-206-718-6 (15. 11.2023)
- The life of a chocolate cake ISBN - 978-624-208-352-0 (02. 08. 2025)
- The Mysterious Door ISBN - 978-624-208-350-6 (02. 08. 2025)
- Lyra ISBN - 978-624-208-351-3 (02. 08. 2025)
- මනුකට හමු වූ රාහුල පොඩි සාදු ISBN - 978-624-208-347-6

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
**4 ශ්‍රේණිය B**
**2025. 02. 08**

**ISBN - 978-624-208-349-0**

# මනුකට හමු වූ රාහුල පොඩි සාදූ

මෙම ග්‍රන්ථය මට කුඩා කල සිට අකුරු ඉගැන්වූ සියලුම
ගුරුමැණීවරුන්ට සහ ගුරු පියවරුන්ටත්,පාසලේ
විදුහල්පතිනිය ඇතුලු ගුරු මණ්ඩලයටත්, මගේ ආදරණීය
දෙමව්පියන් ඇතුලු පවුලේ සියලුම  දෙනාටත්
ඉතා ආදරයෙන් සහ ගෞරවයෙන් පිළිගන්වමි

ආදර්ශ්නා ගජේන්ද්‍රා

# අම්මා

දස මාසයක් කුසේ දරා
මාව උස් මහත් කරලා
සැප දුක නිතරම සොයලා
හදයි මාව වෙහෙස වෙලා

හොඳම පාසලට යවලා
ගුණ දම් මට හුරු කරලා
හරි මග මට පෙන්වාලා
දිරිමත් කරනා අම්මා



# අප්පච්චි

උදේ දවල් සවස රෑට
නෑ වෙනසක් අප්පච්චිට
කලබලයෙන් නිතර දුවයි
අප්පච්චී රෝහල වෙත

කොහොම වුණත් ඇත වෙලාව
අපිත් එක්ක සෙල්ලමකට
බලා ඉන්නෙ නිතරම අපි
ඔබ එනතුරු සවස ගෙදර

ඔබෙ හිනාව ඔබෙ කතාව
ගෙනෙයි සතුට අපට නිතර
ඒ වාගෙම ලොකු වී මම
බෙදමී සතුට මුලු ලොවටම



# ලෝක සාමය

කලුයි, සුදුයි , රතුයි කියා
ඇයි වෙනසක් අපෙ ලෝකෙට
යුධ ගිනි දැල් , වෙඩි ප්‍රහාර
එපා අනේ පුංචි අපට
කන්නට නැති බොන්නට නැති
අසරණුන්ට පිහිට වෙන්න
ලොකු පොඩි අපි හැම දෙනාම
කරමු ලෝකයම ලස්සන



# වැස්සක සතුට

සීතල මඩ වතුර වලක
උඩ පැන පැන හිනා වෙන්න
පුංචි කුරුලු පැටවු වගේ
ආසයි තව තව තෙමෙන්න

බෝට්ටුවක් සදා ඇලේ
ආසයි පා කර හරින්න
වැහි දෙවියනි අපේ සතුට
එපා අනේ නවත්තන්න



# බකමූණා


මොනවා ඇහුවත් ඔබගෙන්
නිතර කියයි "හ්ම් " කියා
ඒක නරක පුරුද්දක්ලු
කිව්වෙ නැද්ද ඔබෙ අම්මා

පොඩි කන් දෙක නිල් ඇස් දෙක
මහත මූණ කොට උල් හොට
අනේ ඉතින් ඔයාගෙ හැඩ
පෙනුණේ මට හඳ එළියට



# අලි රංචුව

මහ කලු ගල් පෙළක් වගේ
වතුරට පැන නාන අගේ
හොඬින් අරන් වතුර දිගට
විදිනව වැස්සක් වාගේ
පේළියකට යන ලස්සන
ඉස්කෝලේ ළමයි වගේ
අලි පැටියෝ ආය එන්න
ගෙදර ළඟින් යන්න අපේ



# නුවර පෙරහැරේ ඇත් රාජා

දළදා මැදුරේ ඩෙංකුටු නාදය
නුවර පුරා පැතිරී යන්නේ
දළදා කරඬුව හිසින් දරාගෙන
රාජ ඇතා දැන් මේ එන්නේ

පාට ඇඳුම් ඇඳ දැල ඇතුන් මැද
සුදු පාවඩයේ ඇවිදින්නේ
රාජ ඇතුනි ඔබ බලන්නටම මම
ඇසළ පෙරහැරට මෙහි එන්නේ



# පරිසරය සුරකිමු

තැන තැන කැළි කසල කුණු රොඩු දමනු එපා
නිතරම බුලත් කා රතු කෙළ ගසනු එපා
මහ ගස් කපා කැලයට ගිනි තබනු එපා
අසරණ සතුන් හට කරදර කරනු එපා

ගසක් කැපුවොතින් දහයක් සිටුවන්න
පොලිතින් ප්ලාස්ටික් භාවිත නොකරන්න
අප සැම රැකෙන ජල සම්පත සුරකින්න
පරිසර අම්මා ඔබෙ පණ මෙන් රැක ගන්න


Keep the
oceans BLUE
Planet GREEN
&
The animals SAFE

# මගේ ගුරුතුමිය

පොත් මිටියත් ගෙන උදෙන්ම පාසල් එන්නේ
ලස්සන ඔසරිය ඇඳ කොණ්ඩයද බඳින්නේ
ආදරයෙන් අපට අකුරු කියලා දෙන්නේ
ගුරුතුමියනි ඔබ නම් මට අම්මා වාගේ



# අපේ ගම

කොළ පාටින් වෙල් යායයි
සීත සුළං සිත සනසයි
ගම වටකර කඳු රැනයි
අපෙ ගම හරි සිරියාවයි

ගම මැද්දෙන් පොඩි පාරයි
පුංචි ගෙවල් පේලි ගොඩයි
කඳු මුදුනේ ඇති පන්සල
මුලු ගමටම සෙත සලසයි



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්



978 624 208 349 0